**බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව - 2022**

**------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය,ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය,වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර202 කාශනවලින් ප්‍රමූල්‍ය ,2 දෙසැම්බර් දිනට 31බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත .

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පත් ගිණුමේ ශේෂය රු.2,302,043 ක් වුවත් එය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ රු. 2,246,108 ක් ලෙස දක්වා තිබුණි. | මෙම වෙනසට හේතුව පොළිය ගණනය කිරීමේ දී ඇති වූ දෝෂයකි.2023 වර්ෂයේදී ගිණුම් පිළියෙල කිරීමේ දී අදාල වරද නිවැරදි කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශනවලට නිවැරදි ශේෂය ඇතුලත් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාලව ස්ථාවර තැන්පතු සඳහා වන පොලිය රු. 190,861 ක් වුවත් එය මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනයේ රු.133,560 ක් ලෙස දක්වා තිබුණි. | මෙම වෙනසට හේතුව පොළිය ගණනය කිරීමේ දී ඇති වූ දෝෂයකි.2023 වර්ෂයේදී ගිණුම් පිළියෙල කිරීමේ දී අදාල වරද නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගණනය කිරීම් නිවැරදිව සිදුකර මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි වටිනාකම ඇතුලත් කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුල කඩ කාමරයක් බදු දීමේදී ලබා ගන්නා ලද ආපසු නොගෙවන රු.255,000 ක තැන්පතු මුදල සමුච්චිත අරමුදලට බැර කර තිබුණි. | මෙය 2023 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙමි. | සභාව සතු ආදායම් වියදම් නිවැරදිව හඳුනාගත යුතුය. |
| (ඈ) | සභාවේ ශ්‍රවණාගාරයට තෙකලා විදුලිය ලබා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුලදී වැයකර තිබුණු රු.226,990 ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | එය 2023 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙමි. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |
| (ඉ) | සභාව විසින් පවත්වා ගෙන යනු ලබන තැන්පත් ලේඛනය අනුව ගිවිසුම් ඇප තැන්පත් ශේෂය රු.1,139,700 ක් වුවත් එය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ රු.1,218,475 ක් ලෙස දක්වා තිබුණි. | මෙය 2019 වර්ෂයේ ගිනුම සඳහා තොරතුරු ලබා දීමේදී සිදුවී ඇති වරදක් බැවින් එළඹෙන වර්ෂයේදී ගැලපීමට කටයුතු කරමි. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු. 5,328,312 ක් වුවත් එය මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනයේ රු. 4,595,841 ක් ලෙස දක්වා තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී ගැලපුම් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙමි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු හා උසාවි දඩ ශේෂයන්ගේ එකතුව රු. 6,077,639 ක් වුවත් එය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ රු.5,288,423 ක් ලෙස දක්වා තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී එම වටිනාකම් ගැලපුම් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂය තුළ දේපල අත්පත්කර ගැනීම හා වැඩි දියුණු කිරීම සඳහා වැයකර තිබුණු රු. 2,918,412 ක ප්‍රාග්ධන වියදම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දේපල පිරියත උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |
| (එ) | සමාලෝචිත වර්ෂයේ ඉදිකිරීම ආරම්භ කර තිබුණු බහුකාර්ය ගොඩනැගිල්ලේ පළමු බිල්පතට අදාල රු.919,657 ක රඳවුම් ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | සියළු වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |
| (ඒ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියට අදාලව සමාලෝචිත වර්ෂය සඳහා ලැබී තිබුණු රු. 19,148,508 ක මුදල ප්‍රාග්ධන ආධාර ලැබීම් ලෙස මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනයේ සහ ව්‍යාපෘතිය යටතේ වැයකර තිබුණු රු.19,951,222 ක මුදල මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | සියලු ආදායම් වියදම් ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| එකතු වටිනාකම රු.321,408,417 ක් වූ වත්කම් විෂයයන් 03 ක් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛන, වෘත්තීය තක්සේරුකරුවන්ගේ වාර්තා හා උපලේඛන යාවත්කාලීන කර ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉඩම් හා ගොඩනැගිලි 2023 වර්ෂයේ තක්සේරු කර ගිණුම් ගතකිරීමටත් ලේඛන යාවත්කාලීන කර නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | වත්කම්වල වටිනාකම් නිවැරදිව තක්සේරු කර ගිණුම්ගත කළ යුතු අතර ලේඛන හා උපලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** 24(1) වගන්තිය | සභාව විසින් පවත්වාගෙන යනු ලබන මාර්ග ඉන්වෙන්ට්‍රියේ ඇතුළත් මාර්ග 251 ක් ගැසට් පත්‍රයේ පළ කර නොතිබුණි. | මාර්ග ඉන්වෙන්ට්‍රියෙහි ඇතුළත් මාර්ග සියල්ල 2023 වර්ෂයේදී ගැසට් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙමි. | මාර්ග ඉන්වෙන්ට්‍රියේ ඇතුලත් මාර්ග ගැසට් පත්‍රයේ පලකළ යුතුය. |
| (ආ) | 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 8 වන වගන්තිය සහ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අති විශේෂ ගැසට් පත්‍රය | සභාව විසින් 2014 සිට 2019 අතර වර්ෂවලදී අනුමතකර තිබුණු ගොඩනැගිලි සැලසුම් 357 ක් පරීක්ෂාකර අනුකූලතා සහතික නිකුත්කර නොතිබුණි. | අනුකූලතා සහතික ලබාගැනීම සඳහා අදාල පුද්ගලයනක් වෙත දැනුම්දීම් සිදුකර ඇති අතර ගොඩනැගිලි කිහිපයක් සඳහා අනුකූලතා සහතික මේ වන විට ලබාගෙන ඇති අතර ඉදිරියේදී අනුමත කරන ගොඩනැගිලි සැලසුම් සඳහා අනුකූලතා සහතික ලබා ගැනීම අනිවාර්ය කර ඇත. | අනුමත සැලසුම් අනුව ඉදිකිරීම් සිදුකරන ලද ගොඩනැගිලි සඳහා අනුකූලතා සහතික කඩිනමින් ලබාදිය යුතුය. |
| (ඇ) | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති චක්‍රලේඛය | සභාව විසින් පවත්වාගෙන තිබුණු වීථි පහන් ලේඛනය අනුව, සභා බලප්‍රදේශයේ වීථි පහන් 485 ක් සවිකර තිබුණද,වීථිආලෝකකරණය සම්බන්ධයෙන් ලංකා විදුලි බල මණ්ඩලය සමඟ ගිවිසුම්ගතවී නොතිබුණි. | වීථි පහන් නඩත්තුව සම්බන්ධයෙන් විදුලි බල හා බල ශක්ති අමාත්‍යාංශය සමග ගිවිසුම් ගත වීමට ඉදිරියේදී කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙමි. | අදාල චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතුයි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,409,424 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,735,625 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2021 ඇස්තමේන්තු ගත ආදායම | 2021 බිල් කළ ආදායම | 2021 රැස්කළ ආදායම | 2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,150,200 | 911,857 | 718,998 | 192,859 | 966,200 | 896,357 | 654,130 | 242,227 |
| (ii) | කුලී | 3,055,200 | 3,695,759 | 3,478,159 | 217,600 | 3,871,400 | 2,526,806 | 2,277,790 | 249,016 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 736,000 | 498,975 | 498,975 | - | 737,000 | 500,500 | 500,500 | - |
| (iv) | වෙනත් ආදායම් | 10,762,500 | 6,839562 | 3,742,510 | 3,097,052 | 10,092,500 | 4,982,088 | 3,084,035 | 1,898,053 |
| | එකතුව | 15,703,900 | 11,946,153 | 8,438,642 | 3,507,511 | 15,667,100 | 8,905,751 | 6,516,455 | 2,389,296 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රු.11,946,153 ක මුළු ආදායමෙන් වර්ෂය අවසාන වන විට රු.3,507,511 ක් අයකර නොතිබුණු අතර එය මුළු බිල්කල ආදායමෙන් සියයට 29 ක් විය. | 2022 වර්ෂයේ අයවැය ලේඛනයෙහි වෙනත් ආදායම් ශීර්ෂය යටතේ දක්වා ඇති රෝස තිරුවානා නිධියෙහි ආදායම උත්පාදනය කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් ඇස්තමේන්තුගත තත්වයන් සමඟ විචලනයන් ඇතිවීමට හේතු වී ඇති බව කාරුණිකව දැනුම් දෙමි. | බිල් කළ ආදායම් අයකරගත යුතුයි. |
| (ආ) | සභා බලප්‍රදේශයේ ස්ථාපනය කර ඇති දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 06 කට අදාලව ඉකුත් වර්ෂ වෙනුවෙන් අයවිය යුතු හිඟ ව්‍යාපාර බදු රු.42,000 ක් 2022 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට අදාළ ආයතන වෙත ලිපි යොමුකර ඇත. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රාදේශීය සභාවට අයත් වත්තේයාය හා නාරම්වත්ත යන ජල යෝජනා ක්‍රමවල ජල පාරිභෝගිකයන් 204 කගෙන් 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 242,359 ක හිඟ ජල ගාස්තු අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් කඩිනමින් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. | -එම- |
| (ඈ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු. 1,561,313 ක් සහ මුද්දර ගාස්තු රු. 3,157,713 ක් විය. | සමාලෝචිත වර්ෂයේ හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අය කර ගැනීම සඳහා ලිපිලේඛන අදාල ආයතන වෙත යොමුකර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | -එම- |
| (ඉ) | සභාව සතු යන්ත්‍ර 3ක් කුලියටදීම වෙනුවෙන් 2017-2020 කාල පරිච්ඡේදයට අදාලව අයවිය යුතු රු. 241,270 ක හිඟ කුලී ආදායම් අයකරගෙන නොතිබුණි. | හිඟ යන්ත්‍ර කුලී ඉදිරියේදී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුයි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පානීය ජලයේ ප්‍රමිතිය හා ගුණත්වය පවත්වාගෙන යාම සඳහා, පවත්නා ජල ව්‍යාපෘති දෙකෙහි ජල සාම්පල පරීක්ෂා කිරීමට 2022 ජනවාරි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට ජල සාම්පල ලබාදීමක් සිදුකර තිබුණද 2022 නොවැම්බර් 04 දින වන විටත් එම වාර්තාව නැවත ලබාගෙන ජලයේ ගුණත්වය සම්බන්ධයෙන් තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ජලයේ ප්‍රමිතිය පරීක්ෂා කිරීමේ කටයුතු මේ වන විට සිදුකරමින් පවතින බව කාරුණිකව දන්වමි. | සභාව මගින් බෙදා හරිනු ලබන ජලයේ ගුණත්වය හා ප්‍රමිතිය ඉහල මට්ටමකින් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | 2016 වර්ෂයේ රු.1,617,483 ක් වැයකර ඉදිකර තිබුණු බෝගහපැලැස්ස කඩකාමර අංක 02 මාර්ග රක්ෂිතයේ ඉදිකිරීම නිසා එම ඉඩමේ අයිතිය සභාව වෙත පවරා ගැනීමට නොහැකිවී තිබුණි. | එය 2023 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙමි. | ඉඩමේ අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2017 නොවැම්බර් 29 දින ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් ප්‍රාදේශීය සභාවට ලැබී තිබුණු චීන ට්‍රැක්ටර් රථයේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | මෙම රථය බඩල්කුඹුර මො/නිශ්ශංක ජාතික පාසලේ උසස් පෙළ කාර්මික අධ්‍යාපන අංශය වෙත භාර දීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | සභාව සතු වත්කම්වල වටිනාකම තක්සේරු කර ගිණුම් ගතකළ යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් භාවිතා කරන වාහන 02 ක නීත්‍යානුකූල අයිතිය සභාවට පවරාගෙන නොතිබුණි. | පවරා නොගත් වාහන 2 හි නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරමි. | සභාව සතු වාහනවල නීත්‍යානුකූල අයිතිය ලබාගත යුතුයි. |
| (ආ) | සභාවට අයත් විවිධ ප්‍රමාණයන්ගෙන් යුතු ඉඩම් 78 ක මැනුම් කටයුතු සිදුකර නොතිබුණු අතර ඉඩම් 98 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මැනුම් කටයුතු සිදු කරන ලද ඉඩම් පැවරීමේ කටයුතු සිදු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා යවා ඇති අතර ඉතිරි ඉඩම් සඳහා ද අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරන බව දන්වා සිටිමි. | සභාව සතු ඉඩම්වල මැනිම් කටයුතු සිදුකර නීත්‍යානුකූල අයිතිය තහවුරු කරගත යුතුය. |
| (ඇ) | 2009 ජුනි 12 දින විශේෂ මහ සභා රැස්වීමේදී කසල ප්‍රතිචක්‍රීකරණ වැඩ සටහන සඳහා යොදා ගැනීමට තීරණයකර පුස්සැල්ලාව ග්‍රාම නිලධාරී වසමේ වෛකුඹුරවත්ත ඉඩමෙන් අක්කර 15ක් 2010 දෙසැම්බර් 14 දින සභාවේ භුක්තියට පවරාගෙන තිබුණි. ඉඩම මැනුම් කටයුතු සඳහා 2010 වර්ෂයේදී රු. 120,000 ක්ද වැයකර තිබුණි.වර්ෂ 11 ක් පමණ දීර්ඝ කාලයක් ගතවී ඇතත් අදාල වැඩ සටහන ක්‍රියාත්මක කර නොතිබුණු අතර 2022 නොවැම්බර් 04 වන විට මෙම ඉඩමෙහි අනවසර පවුල් 25 ක් පදිංචි වී තිබුණි. | පුස්සැල්ලාව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි වෛකුඹුරවත්ත ඉඩම තුළ කසල ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරීමට යාමේදී මහජන විරෝධතා ඇතිවීම නිසා ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. නමුත් මෙම ඉඩම ප්‍රාදේශීය සභාවට පවරා දෙන ලෙස ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ඉල්ලීම් කර ඇත. | සභාව සතු ඉඩම්වල ආරක්ෂාව තහවුරු කරගත යුතුයි. |
| (ඈ) | පුරනැගුම ව්‍යාපෘතිය යටතේ හිඟුරුකඩුව උපකාර්යාලය සඳහා රු.29,228,282 ක වටිනාකමින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකර රු.1,479,300 ක් වටිනා ගෘහ භාණ්ඩ හා උපකරණද සමඟ 2017 ජුනි සභාව වෙත භාරදී තිබුණු නමුත් 2022 නොවැම්බර් වන විටත් එහි පුස්තකාලයක් පමණක් පවත්වා තිබුණි. | මෙම ගොඩනැගිල්ලෙන් කොටසක් මේ වන විට ඵලදායී කටයුතු සඳහා යොදා ගෙන ඇති බව කාරුණිකව දන්වමි. | සභාව සතු වත්කම් උපරිමකාර්යක්ෂමතා වයෙන් හා ඵලදායීව භාවිතයට ගත යුතුයි. |